මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PE/2024/80** **2024.11.13**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14

## මැතිවරණ ප්‍රතිඵල විකාශන අයිතිය ලබා දීම

**01. නිල මැතිවරණ ප්‍රතිඵල නිකුත් කිරීම**

2024 පාර්ලිමේන්තු මැතිවරණයේ සහතික කරන ලද නිල මැතිවරණ ප්‍රතිඵල විකාශනය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ අවසරය ලබා ගත යුතු වේ. අදාළ ගෙවීම් සිදුකර ලියාපදිංචි වන විද්‍යුත් මාධ්‍ය ආයතන සඳහා පමණක් සහතික කරනු ලබන ප්‍රතිඵල, ආරක්ෂිත පරිගණක ජාලයක් මඟින් එසැනින් ලබා දීමට අවශ්‍ය කටයුතු මැතිවරණ කොමිෂන් සභාව විසින් සම්පාදනය කර ඇත. මේ වන විටත් මැතිවරණ ප්‍රතිඵල විකාශන අයිතිය ලබා ගෙන ඇති මාධ්‍ය ආයතනවල ලැයිස්තුවක් මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ සඳහන් කොට ඇත.

**02. නිල නොලත් මැතිවරණ ප්‍රතිඵල ( Un Official Election Results) විකාශනය**

පසුගිය මැතිවරණ වලදී සමහර මාධ්‍ය ආයතන වල ප්‍රාදේශීය නියෝජිතයින් විසින් නිල නොවන ලෙස ලබා ගන්නා ලද ප්‍රතිඵල විකාශනය කිරීමෙන් මැතිවරණ ප්‍රතිඵල කෙරෙහි ඇති මහජන විශ්වාසය බිඳ වැටුණු බව දක්නට ලැබුණි. එබැවින් සියළුම විද්‍යුත් මාධ්‍ය (රූපවාහිනී, චන්ද්‍රිකා රූපවාහිනී, ගුවන් විදුලි, අන්තර්ජාල පුවත්පත්, වෙනත් වෙබ් අඩවි, මුහුණුපොත (Facebook), YouTube, ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවා සහ වෙනත් සමාජ මාධ්‍ය ජාල විසින් නිල නොවන ප්‍රතිඵල විකාශනය කිරීමෙන් සම්පූර්ණයෙන් වැලකී සිටින ලෙස අවධාරණය කරනු ලැබේ.

**03. ප්‍රතිඵල විකාශන අයිතිය සඳහා ලියාපදිංචි නොවූ විද්‍යුත් මාධ්‍ය**

මැතිවරණ ප්‍රතිඵල විකාශන අයිතිය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ විධිමත් ලෙස ලියාපදිංචි නොවන සියළුම විද්‍යුත් මාධ්‍ය ආයතන විසින් ප්‍රතිඵල එසැනින් ප්‍රචාරය කිරීමෙන් වැලකී සිටිය යුතු අතර මැතිවරණ කොමිෂන් සභාව එසේ කරනු ලබන මාධ්‍ය ආයතන පිළිබඳ විමසිල්ලෙන් පසුවන අතර ඒ සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිනු ලැබේ.

<u>සැලකිය යුතුයි</u>

එසේ වුවද එවැනි මාධ්‍ය ආයතන සඳහා සහනයක් වශයෙන් මැතිවරණ කොට්ඨාස 22හි ඒ ඒ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව සහ මන්ත්‍රී ආසන සංඛ්‍යාව සහිත දිස්ත්‍රික් අවසන් ප්‍රතිඵල, පාර්ලිමේන්තු මැතිවරණයේ අවසන් ප්‍රතිඵලය යනාදිය විකාශනය කිරීමට ඔවුන්ට බාධාවක් නොමැති අතර <u>පැයෙන් පැය ප්‍රවෘත්ති විකාශනයක් ලෙස ප්‍රතිඵල සාරාංශ ගත කර ප්‍රකාශ කිරීමට, මහජන අවශ්‍යතාවයක් ලෙස සලකා අවස්ථාව ලබා දිය හැකිය.</u>